# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | මූල්‍ය බුද්ධි ඒකකය |
| දිනය | 2024 නොවැම්බර් 26 |

## මූල්‍ය බුද්ධි ඒකකය විසින් 2024 වර්ෂයේ මැයි මස සිට ඔක්තෝබර් මස දක්වා වූ කාලපරිච්ඡේදය තුළ වාර්තාකරණ ආයතන සඳහා පරිපාලනමය දණ්ඩන පැනවීම

2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 19(1) සහ 19(2) වගන්ති මගින් පැවරී ඇති බලතල අනුව එම පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීමට නියමිත සහ එසේ අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන ආයතන සඳහා දණ්ඩන පනවනු ලැබේ. අදාල අනුකූල නොවන කටයුතුවල ස්වභාවය හා බැරෑරුම්කම සැලකිල්ලට ගෙන මෙම දණ්ඩන නියම කළ හැකිය.

ඒ අනුව, ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ නියාමන ආයතනය ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය විසින් වාර්තාකරණ ආයතනවල අනුකූලතාව බලාත්මක කිරීම සඳහා 2024 වර්ෂයේ මැයි මස සිට ඔක්තෝබර් මස දක්වා වූ කාලපරිච්ඡේදය තුළ පහත දක්වා ඇති පරිදි එකතු කරගන්නා ලද සමස්ත දඩ මුදල රුපියල් මිලියන දෙකයි දශම හතයි පහකි (රු. 2,750,000.00). එලෙස දණ්ඩන මගින් එකතු කරගන්නා ලද මුදල ඒකාබද්ධ අරමුදලට බැර කරන ලදි.

1. **එම්. සී. බී. බැන්ක් ලිමිටඩ්**

**දණ්ඩනය පනවන ලද දිනය** : 2024 ජූලි 26

**වටිනාකම** : රු. 1,000,000.00 (රුපියල් මිලියනයකි)

**දණ්ඩනය ගෙවන ලද දිනය** : 2024 අගෝස්තු 08

**දණ්ඩනය පැනවීමට හේතුව** : පහත දැක්වෙන පරිදි 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත සහ ඒ යටතේ නිකුත් කරන ලද රීතීන්, රෙගුලාසි සහ නියෝගයන්ට අනුකූල නොවීම හේතුවෙන් මෙම පරිපාලනමය දණ්ඩනය පනවන ලදි.

i. 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 6(ආ) වගන්තියට අනුව නිකුත් කරන ලද 2008 අංක 1 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ රෙගුලාසීන්හි අවශ්‍යතාවයන්ට අනුකූලව රුපියල් මිලියනයක් හෝ විදේශ මුදලින් එයට සමාන මුදල් ප්‍රමාණයක් ඉක්මවන වෙළෙඳ මූල්‍ය වලට අදාල විද්‍යුත් අරමුදල් හුවමාරුවීමේ ගනුදෙනු කිහිපයක් මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කිරීමට මෙම බැංකුව අපොහොසත් විය.

**2. බැන්ක් ඔෆ් චයිනා ලිමිටඩ්**

**දණ්ඩනය පනවන ලද දිනය** : 2024 සැප්තැම්බර් 10

**වටිනාකම** : රු. 1,000,000.00 (රුපියල් මිලියනයකි)

**දණ්ඩනය ගෙවන ලද දිනය** : 2024 සැප්තැම්බර් 20

**දණ්ඩනය පැනවීමට හේතුව** : පහත දැක්වෙන පරිදි 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත සහ ඒ යටතේ නිකුත් කරන ලද රීතීන්, රෙගුලාසි සහ නියෝගයන්ට අනුකූල නොවීම හේතුවෙන් මෙම පරිපාලනමය දණ්ඩනය පනවන ලදි.

i. 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 6(ආ) වගන්තියට අනුව නිකුත් කරන ලද 2008 අංක 1 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ රෙගුලාසීන්හි අවශ්‍යතාවයන්ට අනුකූලව රුපියල් මිලියනයක් හෝ විදේශ මුදලින් එයට සමාන මුදල් ප්‍රමාණයක් ඉක්මවන විද්‍යුත් අරමුදල් හුවමාරුවීමේ ගනුදෙනු කිහිපයක් මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කිරීමට මෙම බැංකුව අපොහොසත් විය.

**3. වෝග් ජුවලර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්**

**දණ්ඩනය පනවන ලද දිනය** : 2024 ඔක්තෝබර් 02

**වටිනාකම** : රු. 750,000.00 (රුපියල් හත් ලක්ෂ පනස් දහසකි)

**දණ්ඩනය ගෙවන ලද දිනය** : 2024 ඔක්තෝබර් 10

**දණ්ඩනය පැනවීමට හේතුව** : පහත දැක්වෙන පරිදි 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත සහ ඒ යටතේ නිකුත් කරන ලද රීතීන්, රෙගුලාසි සහ නියෝගයන්ට අනුකූල නොවීම හේතුවෙන් මෙම පරිපාලනමය දණ්ඩනය පනවන ලදි.

i. 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 2(2) වගන්තිය, 2018 අංක 1 දරන නාමෝද්දිෂ්ට මූල්‍ය නොවන ව්‍යාපාර (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියාකිරීමේ) රීතීන්හි 9(2)(ආ), 10(අ) සහ 11 යන රීතීන් වල අවශ්‍යතාවයන්ට අනුව ශ්‍රී ලංකා රුපියල්වලින් හෝ ඕනෑම විදේශීය ව්‍යවහාර මුදලකින් ඇමෙරිකන් ඩොලර් 15,000 කට සමාන හෝ ඊට වැඩි මූල්‍ය ගනුදෙනු සිදු කල ගනුදෙනුකරුවන්ගේ හඳුනාගැනීමේ ලේඛන ලබා ගැනීමට මෙම ආයතනය අපොහොසත් විය.

ii. තව ද, 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 4(1)(ආ) වගන්තිය සහ 2018 අංක 1 දරන නාමෝද්දිෂ්ට මූල්‍ය නොවන ව්‍යාපාර (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියාකිරීමේ) රීතීන්හි 38(1) දරන රීතියෙහි අවශ්‍යතාවයන්ට අනුව ගනුදෙනුකරුවන්ගේ හඳුනාගැනීමේ ලේඛන පවත්වා ගැනීමට සහ තබා ගැනීමට ද මෙම ආයතනය අපොහොසත් විය.